# දශකයක් නුග සෙවණ අබියස....





**දෛනික රූපවාහිනී නැරඹීමේ රටාව වෙනසකට හැර වූ නුගසෙවණ කිසිදු රූපවාහිනී නාලිකාවක් එතෙක් විකාශය සඳහා සුදුසු කාලයක් ලෙස නොසැලකූ උදය කාලය වටිනා විකාශන කාලයක් බවට පත් කළේය.**



නුග සෙවණ ආරම්භක අවදියේදී.......

කුඩා වූ නුග ඵලයකින් හටගත් මහා වෘක්ෂයක් සේ අදින් වසර 10 කට පෙර එනම්, 2000 අප්‍රේල් 17 දින ඇරඹුණු නුගසෙවණ වැඩසටහන වර්තමානය වන විට අතු ඉතිලා වැඩී දස දෙස විසිර විහිද පැතිර සිටින කාන්තාවන් ගේ ඥාණ පෝෂණය සඳහා නැණ සිසිලස සලසමින් සිටී. **නුගසෙවණ බිහි වන තෙක් කාන්තාවන් සඳහා වෙන් වූ සජීවී රූප සඟරාවක් රූපවාහිනී ක්ෂේත්‍රයේ තිබුනේ නැත.** උදෑසන කාලයේ කාර්ය බහුලව නිවසේ පසුවන ගෘහණියන් සඳහා වෙන් වූ වැඩසටහනක් ද එතෙක් බිහිව නොතිබිණ. නුගසෙවණේ අතිශය ජනප්‍රියතාවය හේතුකොට ගෘහණියන්ගෙන් ඔබ්බට දිව යමින්, විශ්‍රාමිකයන් ද රැකියා අපේක්ෂකයන් ද ඒ වටා පෙළ ගැසිණි.

දෛනික රූපවාහිනී නැරඹීමේ රටාව වෙනසකට හැර වූ නුගසෙවණ කිසිදු රූපවාහිනී නාලිකාවක් එතෙක් විකාශය සඳහා සුදුසු කාලයක් ලෙස නොසැලකූ උදය කාලය වටිනා විකාශන කාලයක් බවට පත් කළේය. අනෙකුත් නාලිකාද එය අනුගමනය කරමින් නුගසෙවණ ආකෘතියේ අනුකාරක වැඩසටහන් නිෂ්පාදනයට පෙළඹුනද, රූපවාහිනී සංස්ථාවේ නුගසෙවණ ඉක්මවා යෑමට ඒ කිසිදු වැඩසටහනක් සමත් වූයේ නැත. මුල් වකවානුවේ නිෂ්පාදනය වූ නුගසෙවණ සඳහා දිනපතා උදේ 08.00 සිට 10.00 දක්වා පැය දෙකක කාලයක් වෙන් වී තිබිණ. නුගසෙවණ මංගල වැඩසටහනේ නිෂ්පාදිකාව වූයේ විනීතා කරුණාරත්නයි. ගයා රම්‍යා අල්විස් එහි පළමු ඉදිරිපත් කරන්නා ය. එකල නුග සෙවණ පසුතලය සඳහා පසුතල භාණ්ඩ කිසිවක් තැබුවේ නැත. ඒ වෙනුවට පසුබිම සඳහා ක්‍රෝමා කී ක්‍රමය හෙවත්, කෝර්ගත් පරිගණක රූප සැකැස්මක් ආදේශ කිරීම සිදුවිය.

දිනෙන් දින ජනප්‍රිය තලයට අවතීර්ණ වූ නුගසෙවණ සඳහා වැඩි අවධානයක් ආයතනික වශයෙන්ද ලැබීම හේතුකොට නුගසෙවණ ප්‍රේක්ෂක දත්ත සමීක්ෂණ හා ප්‍රතිපෝෂණ උපක්‍රම ආදිය මගින් කාන්තාවගේ රුචි අරුචිකම් විමසමින් වැඩසටහන සංවර්ධනය කිරීමේ ක්‍රියාදාම සිදු කෙරුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නුගසෙවණ කාන්තාවන් අතර ජනප්‍රියතම වැඩසටහන බවට පත් වෙමින් එහි ප්‍රේක්ෂකයින්ගේ ප්‍රමාණය තුන් හතර ගුණයකින් වැඩි විය. මුලදී අනුග්‍රාහකයින් නොසිටියත්, වැඩිකල් නොගොස්ම එහි ඉදිරිපත් වූ සෑම වැඩසටහන් අංගයකටම අනුග්‍රාහක දායකත්වය ලැබිණි. වර්තමානය වන විට නුගසෙවණ රූපවාහිනී තිරයේ බාධා නොවන අවකාශය වෙළඳ දැන්වීම් වලින් පිරී යන තරමට අනුග්‍රාහකයින් වැඩසටහන හා බැඳී සිටී.

10th Anniversery නුග සෙවණ